## ඔහු....

### අධ්‍යාපනයෙන්

- අත්තනගොඩ කණිෂ්ඨ විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබා ශිෂ්‍යත්ව විභාගය උසස් ලෙස සමත් වී කෑගලු විද්‍යාලයට ඇතුලත් විය.
- අ.පො.ස සා/පෙළ A-8 ක ප්‍රතිඵලයක් සහිතව උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් A-3 ක් සමඟ ඉහළ දිස්ත්‍රික් කුසලතාවයක් සමඟ පේරාදෙණිය වෛද්‍ය පීඨයට ඇතුල් විය.
- වෛද්‍ය පීඨ අධ්‍යාපනය අතර තුරම ලංකා රසායන විද්‍යා ආයතනයේ රසායන විද්‍යා විශේෂ උපාධිය හදාරන ලදී (Graduate Chemist)
- අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකි.
- පසු කාලීනව අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි තිබූ ඇල්ම නිසාම අධ්‍යාපනය පිළිබඳව ආචාර්ය උපාධිය හදාරන ලදී, (Ph.D in Education)

### වෘත්තියෙන්

- වසර 20 කට අධික කාලයක් ප්‍රධාන නගර වල උපකාරක පන්ති ගුරුවරයෙක් වශයෙන් ද පාසල් සහ පුද්ගලික ආයතන ගණනාවක ආරාධිත දේශකවරයෙක් වශයෙන් ද දරු දැරියන්ට අධ්‍යාපනය ලබා දීමෙහිලා විශාල මෙහෙවරක් කරන ලද්දෙකි.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර කිහිපයක අධ්‍යක්ෂක වරයෙකු ලෙස සෘජු හා වක්‍ර රැකියා රාශියක් උත්පාදනය කරන ලද්දෙකි.
- අපනයනකරුවෙකු ලෙස රටේ විදේශ විනිමය ඉහළ නැංවීම සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන්නෙකි.
- චිත්‍රපට නිෂ්පාදකවරයෙකු ලෙස කලා ලොව තුළ ජනප්‍රියතාවයක් දිනා සිටින්නෙකි.

### හිතවතෙකු ලෙස

- සමාජ සේවකයෙක් ලෙස දිස්ත්‍රික්කය තුළ සහ ඉන් පිටත අවශ්‍ය අවස්ථාවලදී නිරන්තරයෙන් ක්‍රියාත්මක වන සොහොයුරෙකි.
- සමන් එදිරිසිංහ සමාජ සත්කාරක පදනම හරහා ප්‍රදේශයේ පාසල් සහ දහම් පාසල් සඳහා උපකරණ හා දහම් පාසල් ඇඳුම් සඳහා රෙදිපිළි, ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර ලබාදීම වැනි ක්‍රියාකාරකම් වල නිරන්තරයෙන් යෙදෙන්නෙකි.
- අඩු ආදායම්ලාභී දූ පුතුන්ට උසස් අධ්‍යාපනය සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව 100 බැගින් වසර 20 ක් තිස්සේ පුද්ගලිකව ප්‍රදානය කරන ලද්දෙකි.



සර්වජන බලය 3

சர்வஜன அதிகாரம் • SARVAJANA BALAYA



# නැණස පෑදූ මිනිසා...

කෑගල්ලෙන්

ආචාර්ය

# සමන් එදිරිසිංහ

සර්වජන බලය 3

சர்வஜன அதிகாரம் • SARVAJANA BALAYA

38 වසරක් ගෞරවනීයව දිවි ගෙවූ මේ උදාරතර පුණ්‍ය භූමියේ,
භෞමික අඛණ්ඩතාවය සුරකිමින්, දේශයේ ඒකීයත්වය උදෙසාත්,
ජාතියේ චිරජීවනය උදෙසාත්, නොපැකිළිව කැපවීමට
අදිටන් කොට 19 වසරක ගුරු ජීවිතයට තාවකාලිකව නැවතුමක්
තබා මිලියන 22 ක ජනතාවගේ ප්‍රාර්ථනාවන්ට පණ දෙන්නටත්,
කෑගලු දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික දේශපාලනයෙන් මිදී
යහපත් වූත්, කාලෝචිත වූත් මානුෂීය සේවයක් සඳහාත්
දිවිහිමියෙන් කැපවෙමි.

සමන් එදිරිසිංහ

## ඇයි ?

### විපක්ෂයක් අවශ්‍ය...?

- ඉහළ ආණ්ඩු බලයක් හිමි ආණ්ඩු පක්ෂයක් පාර්ලිමේන්තුව තුළ අණ පනත් සම්මත කරගැනීමේ දී ජනතාවට හිතකර නොවන මතු දවසකදී හෝ හානි දායක වන සම්මත කර ගැනීමකදී ආණ්ඩු පක්ෂයේ සාතිශය බහුතරය එකඟ වුවද ශක්තිමත් විපක්ෂයක් පවතී නම් ඊට විරුද්ධව හඬක් නැගිය හැකිය.

එසේම පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂය ගෙන යන වැඩ පිළිවෙල පිළිබඳව නිවැරදි අදහස ජනතාව හමුවේ තැබීම විපක්ෂයේ කාර්යය භාරයේ කොටසකි.

නිවැරදි ආණ්ඩු පක්ෂයක් මෙන් ම එය නිවැරදි මගෙහි ගමන් කිරීම නිරීක්ෂණය කිරීමට ශක්තිමත් විපක්ෂයක් ද අත්‍යාවශ්‍ය බව අපේ විශ්වාසයයි.

### විපක්ෂයක් ලෙස සර්වජන බලය...?

- පසුගිය පාර්ලිමේන්තුවේ සිටි ජනතා ප්‍රසාදය දිනූ මන්ත්‍රීවරු ගණනා--වක්ද සමගින් සුදුසු නවක අපේක්ෂකයින් රැසක් පිරිවරා මැතිවරණය සඳහා ඉදිරිපත් වන සර්ව ජනබලය සන්ධානය නිවැරදි නායකත්වයක මෙහෙවීමකි. විදේශ බලවේග වල සහ අදෘශ්‍ය දක්ෂිණාංශික බල වේග වල අතකොලුවක් නොවී ව්‍යවසායකත්වයෙන් අනාගත අභියෝග ජයගන්නා දැක්ම සර්වජන බලය සන්ධානය සතුයි.

### ඔහුව තෝරාගත යුත්තේ...?

- පාර්ලිමේන්තුව තුල අප වෙනුවෙන් හඬක් නැගිය හැකි පෞරුෂයක් හා දැක්මක් සහිත තරුණයෙකු බැවිනි.
- අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා පිළිබඳ හසල දැනුමක් සහ පළපුරුද්දක් ඇති බැවිනි.
- දේශපාලනය තුළ නවකයෙකු වන අතර පුද්ගලික ලාභ හෝ වාසිතකා දේශපාලනයේ නොයෙදෙන්නෙකි.
- ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සෑම අවස්ථාවකම ඔවුන්ට උදව් උපකාර කරන හිතවතෙකි/ මිතුරෙකි.
- කුඩා පරිමාණයෙන් ආරම්භ කරන ලද ව්‍යාපාර ගණනාවක් සීඝ්‍රයෙන් සංවර්ධනය කරන ලද තරුණ ව්‍යවසායකයෙක් වන බැවිනි.

# නැණස පෑදූ මිනිසා...



ශක්තිමත් විපක්ෂයකට තරුණ හඬක්...



අංක 22, නිල්මල්ගොඩ පාර, කෑගල්ල යන ලිපිනයේ පදිංචි රෝහණ පුෂ්පකුමාර වන මා විසින් මහරගම පතිරගොඩ S&A ආයතනයෙන් මුද්‍රණය කරවා බෙදා හරින ලදී.